ඇමුණුම 02

<u>වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාස වෙන් කර ගැනීමේ අයදුම්පත</u>

**(නිවාඩු වෙනුවෙන් කරන ඉල්ලීම දින තුනකට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.)**

1) ක්ෂේත්‍ර නිවාසයේ නම : ..............................................................................................

2) අවශ්‍ය කාල පරිච්ඡේදය : ........................................... දින පෙ.ව. 10.00 සිට ...........................................දින

පෙ.ව. 9.00 දක්වා (රාත්‍රී ගණන ............. )

3) අයදුම්කරුගේ

I නම : ..............................................................................................

II ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

III දැනට දරන තනතුර : ..............................................................................................

IV කාර්යාලීය ලිපිනය : ..............................................................................................

V පෞද්ගලික ලිපිනය : ..............................................................................................

VI දුරකථන අංක : රාජකාරි : | | | | | | | | | | |

පෞද්ගලික : | | | | | | | | | | |

4) වෙන් කිරීම : රාජකාරි : ☐ නිවාඩු ගත කිරීම : ☐

5) නවාතැන් ගැනීමට අපේක්ෂිත අය පිළිබඳ විස්තර. (වයස අවු. 10ට වැඩි සියලුම අයගේ නම් ද ඇතුළත් කළ යුතුයි.) නවාතැන් ගත හැකි උපරිම සංඛ්‍යාව ඉක්මවා ඉදිරිපත්වන අයදුම්පත් අවලංගුවන බව කාරුණිකව දන්වමි

| | නම | තනතුර/ අයදුම්කරුට ඇති සම්බන්ධතාව | විවාහක/ අවිවාහක බව | ජා.හැ.අ. |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| 9 | | | | |
| 10 | | | | |
| 11 | | | | |
| 12 | | | | |
| 13 | | | | |
| 14 | | | | |
| 15 | | | | |

ක්ෂේත්‍ර නිවාසයේ වෙන් කිරීම සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ බල පවත්වන නීති රීති පිළිගැනීමට එකඟ වෙමි.(අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට යටත්වේ.)

ඉහතින් සඳහන් කළ විස්තර සත්‍ය හා නිවැරදි බවත්, පසුපිටේ සඳහන් කොන්දේසි වලට එකඟ වන බවත් අවසර ලබා දී ඇති නේවාසික සංඛ්‍යාව පමණක් මෙහි නවාතැන් ගැනීමට කටයුතු කරන බවත් එම නේවාසිකයින් වෙතින් මෙම ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයෙහි අලාභ හානියක් සිදු වුවහොත් ඊට අදාළ අලාභය මාගේ වැටුපෙන් අයකර ගැනීමට එකඟ වන බවත් මෙයින් පොරොන්දු වෙමි.

........................................ ........................................

දිනය අත්සන

---

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,

<u>නිර්දේශ කර ඉදිරිපත් කරමි.</u>

අංක 3 යටතේ i සිට vi දක්වා සඳහන් විස්තර නිවැරදිය. ඉහත අයදුම්කරු මෙම........................................අංශයේ/කාර්යාලයේ සේවය කරන අතර ඉහත කාල පරිච්ඡේදය සඳහා මෙම නිලධාරියාට නිවාඩු /රාජකාරි නිවාඩු අනුමත කර ඇත.

........................................ ........................................

දිනය ශාඛා/කොට්ඨාශ/ආයතන ප්‍රධානියාගේ

අත්සන හා නිල මුද්‍රාව

කොන්දේසි,

1. අයදුම්පත්‍රයේ නම සඳහන් අයට පමණක් නවාතැන් ගැනීමට ඉඩදෙනු ලැබේ.

2. නවාතැන්/ඇඳ අතිරිලි/ අනෙකුත් ගාස්තු ක්ෂේත්‍ර නිවාසය භාරකරු වෙත ගෙවා කුවිතාන්සිය ලබා ගත යුතුයි.

| | |
|---|---|
| ඇඳ ඇතිරිල්ලක් | - රු. 50.00 |
| කොට්ට උරයක් | - රු. 20.00 |
| මේස රෙද්දක් | - රු.25.00 |
| නාන තුවායක් | - රු..30.00 |
| මුහුණ පිහින තුවායක් | - රු.20.00 |
| අත් පිස්නාවක් | - රු 5.00 |

3. නවාතැන් ගැනීමට ඉල්ලුම් කිරීමෙන් පමණක් නිවාසය වෙන් කර දීමට දෙපාර්තමේන්තුව බැඳී නොසිටින අතර, වෙන් කිරීමේ ලිපි නිකුත් කිරීමෙන් පසු පමණක් වෙන් කිරීම සනාථ වේ.

4. ක්ෂේත්‍ර නිවාසය වෙන් කර ගත් තැනැත්තා, වෙන් කර ඇති කාමර වෙත යාමට පෙර නවාතැන් ගන්නා ඉහත නම සඳහන් වයස අවු. 10 වැඩි සියලුම අයගේ නම ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයේ පවත්වාගෙන යනු ලබන ලේඛනයේ සටහන් කර තමාගේ අත්සන යෙදිය යුතුය.

5. රියදුරන් සඳහා කාමර වෙන් කර නොමැති අතර රියදුරු කාමර තිබෙන අවස්ථා වලදී එම කාමර රියදුරන්ට භාවිතා කළ හැකිය.

6. ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයේ වාසය කරන කාල සීමාව ඇතුළත එහි දේපල වලට හානියක් නොවන පරිදි හැසිරිය යුතුය. එවැනි අලාභයන් සඳහා වටිනාකම ඔබගෙන් අය කිරීමට කටයුතු කරනු ඇත.

7. මෙම ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයේ උත්සව හා ප්‍රීති සම්භාෂණ පැවැත්වීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

8. ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයේ ගත කරන කාලය තුළ සිදුවන යම් අයථා ක්‍රියාවන් සම්බන්ධයෙන් ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඉදිරියේදී නිවාස වෙන් කිරීම පිළිබඳව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

9. රාජකාරි අවශ්‍යතාවයන් මත ඔබ විසින් කරනු ලබන වෙන් කිරීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකිය.

මගේ අංකය :- DI/WG&BS/OMGT/W3/FIB/පොදු/2022
වැඩපොළ හා ගොඩනැගිලි සේවා අංශය
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
කොළඹ 07.
2024.02.05

ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය,
සියළුම අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරු, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පාලන),
ප්‍රධාන මූල්‍ය නිලධාරී, සියළුම වාරිමාර්ග අධ්‍යක්ෂවරු/ ව්‍යාපෘති අධ්‍යක්ෂවරු/යාන්ත්‍රික අධ්‍යක්ෂවරු,
අධ්‍යක්ෂ(වාරි කළමනාකරණ අංශය), ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියළුම ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරු/ යාන්ත්‍රික ඉංජිනේරුවරුන්,
සියළුම අංශ ප්‍රධානීන්

**වාරිමාර්ග දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයන්හි ගාස්තු සංශෝධනය කිරීම.**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාස සඳහා වන ගාස්තු සම්බන්ධයෙන් පහත උපදෙස් නිකුත් කරනු ලැබේ. මෙම සංශෝධිත ගාස්තු 2024.02.15 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

02. ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයන්හි සංශෝධිත නවාතැන් ගාස්තු පහත පරිදි වේ.

| අනු අං. | වර්ගය | එක් අයෙකුට එක් දිනකට (රු.) | | | |
|---|---|---|---|---|---|
| | | රාජකාරි | | නිවාඩු | |
| | | වායුසමනය කළ | වායුසමනය නොකල | වායුසමනය කළ | වායුසමනය නොකල |
| 1 | දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ නිලධාරීන් සඳහා | 150 | 150 | 500 | 350 |
| 2 | වාරිමාර්ග දෙපාර්තමේන්තු විශ්‍රාමික නිලධාරීන් සඳහා | – | – | 700 | 500 |
| 3 | වාරිමාර්ග දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ නිලධාරීන් සමඟ පැමිණෙන පවුලේ සමාජිකයන් සඳහා | – | – | 700 | 500 |
| 4 | වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ නිලධාරීන් සඳහා | 1500 | 1000 | 2500 | 2000 |
| 5 | වාරිමාර්ග දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ නිලධාරීන් සමඟ පැමිණෙන පිටස්තර පුද්ගලයන් සඳහා | – | – | 1500 | 1000 |
| 6 | අර්ධ රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා | 1500 | 1000 | 2500 | 2000 |
| 7 | වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නිලධාරීන් සඳහා | 700 | 500 | 2500 | 2000 |
| 8 | බාහිර පුද්ගලයන් සඳහා (වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විශේෂ අනුමැතියක් අවශ්‍ය වේ) | – | – | 3500 | 3000 |

I. අංක 01 යටතට දැනට සේවයේ සිටින දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ නිලධාරීන් අදාල වන අතර දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශයේ සේවය කරමින් සිටියදී උසස්වීම් ලබා වෙනත් ආයතන වල සේවය කරනු ලබන විධායක ශ්‍රේණියේ නිලධාරීන්ද අයත් වේ.

II. අංක 02 යටතේ වන දෙපාර්තමේන්තු විශ්‍රාමික නිලධාරීන් වන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තු පත්වීමක් ලබා සේවය කර විශ්‍රාම ලබා ගත් නිලධාරීන් හා විශ්‍රාම ලබන අවස්ථාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශය යටතේ සේවය කරමින් සිටි විධායක ශ්‍රේණියේ නිලධාරීන් අදාල වේ.

III. අංක 03 යටතේ වන පවුලේ සාමාජිකයන් ලෙස අදාල වන්නේ අයදුම්කරුගේ මව, පියා, කලත්‍රයා, අවුරුදු 12ට වැඩි අවිවාහක දරුවන්, අවිවාහක සහෝදර සහෝදරියන් හා කලත්‍රයාගේ මව, පියා, අවිවාහක සහෝදර සහෝදරියන් වේ.

IV. අංක 04 හා 06 යටතේ වන නිලධාරීන් සඳහා නිවාඩුගත කිරීමට ලබා දීම සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් චක්‍රලේඛයක් නිකුත් කරන තෙක් එම නිලධාරීන්ට නිවාඩු ගත කිරීමට වෙන් නොකරනු ලබයි.

3. ඇඳ ඇතිරිලි හා කොට්ටා උර සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු පහත පරිදි වේ.

| අනු අංක | අයිතමය | ගාස්තු රු. |
|---|---|---|
| 01. | ඇඳ ඇතිරිල්ලක් | 200.00 |
| 02. | කොට්ටා උරයක් | 100.00 |
| 03. | නාන තුවායක් | 100.00 |
| 04. | මේස රෙද්දක් | 100.00 |
| 05. | අත් පිස්නාවක් | 50.00 |
| 06. | පොරවන (Blanket) | 200.00 |

4. කන්දෙඇල හා අඹේවෙල වැනි නිවාසයන්ගේ කාමර උණුසුම් කිරීමට හා උණුසුම් ජලය සඳහා වැඩි විදුලි ප්‍රමාණයක් වැය වීම නිසාවෙන් අයකරනු ලබන මුදල වායු සමීකරණ පවතින නිවාසයන් සඳහා අයකරනු ලබන මුදල අයකිරීමට කටයුතු කරනු ලැබේ.

5. නවාතැන් ගැනීමට පැමිණෙන පුද්ගලයන් අවශය යැයි කියන්නා වූ ආහාරපාන සපයා දීම බංගලා භාරකරු විසින් සිදුකල යුතුය. සපයනු ලබන ආහාරපානයන්ගේ අන්තර්ගතය හා ප්‍රමාණයන් පිළිබඳ සැලකිල්ලට ගනිමින් දෙපාර්ශවයටම අසාධාරණයක් නොවන පරිදි ගාස්තුවක් සාකච්ඡා කරගත යුතු අතර ඒ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

6. මෙම ඉහත යෝජනා මගින් ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසයන්හි අයකරනු ලබන ගාස්තු පමණක් සංශෝධනය කරන අතර ඉදිරියේදී මෙම කරුණුද ඇතුලත් කරමින් සවිස්තරාත්මක නව චක්‍රලේඛයක් නිකුත් කරනු ලබන බව කාරුණිකව දන්වමි.

A. Gunasekara

ඉංජි. අජිත් ගුණසේකර

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.